# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 10 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | 4 ඒකකය |
|---|---|---|

## කුසල් සිත් වැඩි දියුණු කරමු.

### I කොටස

**01. නිවැරදි පිළිතුර ලකුණු කරන්න.**

1. බෞද්ධ භාවනාව ප්‍රධාන කොටස්,
   i. 04 කි ii. 05 කි iii. 03 කි iv. 02 කි

2. සමථ යන්නෙහි අදහස වන්නේ,
   i. සිත සන්සුන් කරන්නේ සමථයයි
   ii. සිත පාලනය කරන්නේ සමථයයි
   iii. කෙලෙස සපුරා බැහැර කරන්නේ සමථයයි
   iv. ඉහත සියල්ල කරනුයේ සමථයයි

3. "චිත්තං සමේතීති සමථො" යන්නෙහි නිවැරදි අදහස වන්නේ,
   i. සිත සන්සුන් කරන්නේ විදර්ශනාවයි
   ii. සිත කය සන්සුන් කරන්නේ සමථයයි
   iii. සිත සන්සුන් කරන්නේ සමථයයි
   iv. සිත සන්සුන් කරන්නේ සමථය නොවේ

4. උතුරන, බුබුළු නැගෙන ජලයට උපමා කර ඇත්තේ,
   i. කාමච්ඡන්ද නීවරණයයි
   ii. ව්‍යාපාද නීවරණයයි
   iii. උද්දච්ච කුක්කුච්ච නීවරණයයි
   iv. ථීනමිද්ධ නීවරණයයි

5. භාවනා වැඩීමේදී ඉරියව් සංඛ්‍යාත්මකව කොපමණද?
   i. 05 කි ii. 02 කි iii. 06 කි iv. 04 කි

6. පංච නීවරණ මගින් පුද්ගලයාට සිදුවන හානිය වන්නේ,
   i. කායික රෝග ඇතිවීමයි
   ii. නිවන් මග අහුරා දැමීමයි
   iii. නිවන් මගට යොමු කිරීමයි
   iv. සසර ගමන කෙටි කිරීමයි

7. සමථ භාවනාවේ කර්මස්ථාන ගණන වනුයේ,
   i. 10 කි ii. 20 කි iii. 30 කි iv. 40 කි

8. සිතේ උදාසීන ගතිය කියවෙන නීවරණය වන්නේ,
   i. ථීන මිද්ධයයි
   ii. විචිකිච්ඡාවයි
   iii. ව්‍යාපාදයයි
   iv. උද්දච්ච කුක්කුච්චයයි

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

9. උද්දකරාම පුත්ත තවුසා ලබා තිබූ ධ්‍යාන සමාපත්තිය වූයේ,
   i. අෂ්ට සමාපත්තිය
   ii. පංච අභිඥායයි
   iii. ප්‍රථම ධ්‍යානයයි
   iv. චතුර්ථ ධ්‍යානයයි

10. භාවනාවට පිවිසෙන්නා තුළ තිබිය යුතු පූර්ව අවශ්‍යතාවක් නොවන්නේ,
   i. සිල්වත් වීමයි
   ii. කල්‍යාණ මිත්‍ර ආශ්‍රයයි
   iii. අලස ස්වභාවයයි
   iv. විර්යයි

## II කොටස

- **පහත සඳහන් ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

02. 1. භාවනාවේ පුද්ගල චරිත ස්වභාවය අනුව හයකි. හතරක් නම් කරන්න.
2. භාවනා යන්නෙහි විග්‍රහ වාක්‍ය ලියා පාලි පාඨය ලියන්න.
3. ෂඩ් ඉන්ද්‍රිය නම් කරන්න.
4. ''සති සම්පජඤ්ඤ'' යන්නෙහි අර්ථය ලියන්න.
5. කුසලය කුමක්ද යන්නෙහි පාලි පාඨය ලියන්න.
6. ත්‍රිවිධ අකුසල මූල නම් කරන්න.
7. සමථ භාවනාව හඳුන්වන්න සමානාර්ථ වෙනත් නම් තුනක් සඳහන් කරන්න.
8. පංච අභිඥා නම් කරන්න.
9. සුගත යන බුද් ගුණයෙහි අර්ථය ලියන්න.
10. බුදු ගුණ සිහි කරමින් ප්‍රගුණ කරන භාවනාව නම් කරන්න.

03. 1. භාවනාවේ සතර ඉරියව් නම් කරන්න.
2. භාවනාවට සූදානම් වන අයුරු කෙටියෙන් සඳහන් කරන්න.
3. පංච නීවරණ යටපත් කර සිත එකඟ කර ගැනීමෙන් ශිෂ්‍ය ජීවිතයට ලැබෙන ප්‍රයෝජන පිළිබඳ පැහැදිලි කරන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!